අමුණුම 02

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/4/58/8/1/4/DOE (V)

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2025.08.

...................................

ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණිය

සම්මුඛ පරීක්ෂණ අංකය : .........................................

මහත්මයාණෙනි / මහත්මියනි,

**<u>අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරු සඳහා පත් කිරීමේ සම්මුඛ පරීක්ෂණය - 2025</u>**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථානුකූලව එම සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් අතරින්, අධ්‍යාපන අමාත්‍යාංශයේ හා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල පුරප්පාඩුව පවතින අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරුවලට සුදුසු නිලධාරීන් පත්කිරීමට පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය 2025.09……. දින පෙ.ව. 8.30 ට බත්තරමුල්ල, ඉසුරුපාය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ දී පැවැත්වේ. එදිනට අධ්‍යාපන ලේකම් කාර්යාල කමිටු ශාලා පරිශ්‍රයට (3 වන මහල) පැමිණෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

02. එදිනට පහත සඳහන් ලිපි ලේඛන වල මුල් පිටපත් හා එම ලේඛනයන්හි සහතික කරන ලද ඡායා පිටපත් පහත අංක i සිට xx දක්වා වූ අංක අනුපිළිවෙලට වෙන වෙනම ලිපි ගොනු දෙකක් ලෙස අමුණා ඔබගේ නම හා සම්මුඛ පරීක්ෂණ අංකය ගොනුව ඉදිරියෙහි සඳහන් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

i. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපිය
ii. ජාතික හැඳුනුම්පත / විදේශ ගමන් බලපත්‍රය
iii. උප්පැන්න සහතිකය
iv. ඉදිරිපත් කරනු ලබන සහතිකයන්හි නමෙහි වෙනසක් පවතී නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක්
v. මුල් පත්වීම් ලිපිය
vi. පත්වීම ස්ථිර කිරීමේ ලිපිය
vii. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියට උසස් කිරීමේ ලිපිය
viii. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I පන්තියට /ශ්‍රේණියට උසස් කිරීමේ ලිපිය
ix. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I පන්තියේ / ශ්‍රේණියේ වැඩ භාරගැනීමේ ලිපිය
x. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පත් වීම සඳහා අදාළ කරගන්නා ලද මූලික උපාධිය / ගුරු පුහුණු සහතිකය / ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව
xi. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියට උසස් කිරීම සඳහා අදාළ කර ගන්නා ලද අධ්‍යාපනවේදී උපාධිය / පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා / අධ්‍යාපන කළමණාකරණය හෝ බඳවාගත් විෂයට අදාළ පශ්චාත් උපාධි ඩිප්ලෝමා හෝ පශ්චාත් උපාධි සහතිකය
xii. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් කිරීම සඳහා අදාළ කර ගන්නා ලද පශ්චාත් උපාධි සහතිකය
xiii. II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කළ බවට නිකුත් කළ ලිපිය
xiv. ඉහත xiii නිදහස් කිරීමට අදාළ අධ්‍යාපනවේදී උපාධි / අධ්‍යාපන කළමණාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා / පශ්චාත් උපාධි ඩිප්ලෝමා / පශ්චාත් උපාධි සහතිකය



CamScanner

xv. බඳවා ගැනීම, II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කිරීමට අදාළ සහතිකය හා ශ්‍රේණි උසස්වීම් සඳහා අදාළ කර ගන්නා ලද සහතික හැර ලකුණු පටිපාටියේ නිර්ණායක අංක 02 අනුව සම්පූර්ණ කර ඇති වෙනත් අධ්‍යාපන සුදුසුකම්

xvi. සේවා සහතිකය (ශ්‍රී ලං.අ.ප.සේවයට බඳවා ගත් දින සිට අයදුම්පත් කැඳවන අවසාන දින දක්වා දැරූ තනතුරු හා එක් එක් තනතුර දැරූ කාලපරිච්ඡේද වෙන වෙනම පෞද්ගලික ලිපි ගොනුව ආශ්‍රිතව ලබා ගත යුතුය)

xvii. ඉහත අංක xi, xii, xiv හා xv හි සඳහන් පශ්චාත් උපාධියට / පශ්චාත් උපාධි ඩිප්ලෝමාවට ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ වූ පර්යේෂණ නිබන්ධන හැර ලකුණු පටිපාටියේ 3.1 නිර්ණායකයට යටතට අයත් වන වෙනත් පර්යේෂණ නිබන්ධන (එක් එක් පර්යේෂණ නිබන්ධනයේ මාතෘකාව සහිත පිටුවෙහි, පර්යේෂණය කුමක්ද යන්න පැහැදිලිව දක්වා ඇති පිටුවෙහි, පර්යේෂක ලෙස ඔබගේ නම සඳහන් වන පිටුවෙහි, අදාළ විශ්වවිද්‍යාලයේ / ආයතනයේ නම සඳහන් පිටුවෙහි ඡායා පිටපතක් ගොනුවට ඇමිණිය යුතු අතර පර්යේෂණ නිබන්ධන සම්මුඛ පරීක්ෂණයට රැගෙන ආ යුතුය)

xviii. පෙළපොත් හා ඒ ආශ්‍රිත පරිශීලන ග්‍රන්ථ හැර අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශන මණ්ඩලය මගින් අනුමත ප්‍රකාශන (මාතෘකාව සහිත පිටුවෙහි, ප්‍රකාශනය කුමක් අරභයාද යන්න පැහැදිලිව දක්වා ඇති පිටුවෙහි, කතෘ / ප්‍රකාශක ලෙස ඔබගේ නම සඳහන් වන පිටුවෙහි, අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශන මණ්ඩලය මගින් අනුමත බව සඳහන් පිටුවෙහි ඡායා පිටපත් ගොනුවට ඇමිණිය යුතු අතර ප්‍රකාශන සම්මුඛ පරීක්ෂණයට රැගෙන ආ යුතුය)

xix. ශාස්ත්‍රීය සංග්‍රහ, සඟරා සහ වාර ප්‍රකාශන, පුවත්පත්වල පළ කරන ලද තනි පුද්ගල ප්‍රවෘත්තිමය ස්වරූපයේ නොවන අධ්‍යාපන ක්ෂේත්‍රයට අයත් කරුණකට අදාළ ශාස්ත්‍රීය ලිපි හෝ වාර්තා (මාතෘකාව සහිත පිටුවෙහි, ප්‍රකාශනය කුමක් අරභයාද යන්න පැහැදිලිව දක්වා ඇති පිටුවෙහි, කතෘ ලෙස ඔබගේ නම සඳහන් වන පිටුවෙහි ඡායා පිටපත් ගොනුවට ඇමිණිය යුතු අතර ප්‍රකාශනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයට රැගෙන ආ යුතුය)

xx. ලකුණු පටිපාටියේ අංක 06 අනුව ඉදිරිපත් කිරීමට අදාළ දෘශ පිටපත. (පිටපතක් ගොනුවට ඇමිණිය යුතුය)

03. මෙම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමම පමණක් අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරකට පත්වීම් ලැබීම සඳහා හිමිකමක් නොවන බව ද, දැනට පුරප්පාඩු වී ඇති අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරු සියල්ල සඳහාම නිලධාරීන් පත්කිරීමේ හෝ තනතුරු කිහිපයක් සඳහා පමණක් නිලධාරීන් පත්කිරීමේ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව සතු වන බව ද, වැඩිදුරටත් අවධාරණය කරමි.

04. නියමිත දින මෙම සම්මුඛ පරීක්ෂණයට සහභාගී නොවන්නේ නම් ඒ සඳහා වෙනත් දිනයක් ලබා නොදෙන හෙයින් එවැනි ඉල්ලීම් සලකා බලනු නොලබන බවද, අදාළ ලිපිලේඛන සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන අවස්ථාවේදී අනිවාර්යයෙන්ම ඉදිරිපත් කල යුතු බවද කාරුණිකව දන්වමි.

05. සම්මුඛ පරීක්ෂණයට සහභාගීවීම වෙනුවෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

කේ.කේ.පී. ආරියසිංහ
අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන)

අත්.කළේ :- නාලක කලුවැව
ලේකම්



CamScanner